# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය
# ස්වයං මූලෝෂ්පාදන සුභසාධක අරමුදලේ ණය යෝජනා ක්‍රමය

## 01 - අරමුණු

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ සියලුම ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා ණය මුදලක් ලබා දීම.

## 02 - ණය මුදල

2.1 උපරිම ණය මුදල - රුපියල් දෙලක්ෂ පනස්දහසකි. (250,000/-)

## 03 - ණය ප්‍රදානය සඳහා වන සීමා

3.1 ආපසු ගෙවීමේ කාලය - අවුරුදු 05 (වාරික 60)

3.2 පොළී අනුපාතය - වාර්ෂිකව සියයට 7.5 (7.5%)කි.

## 04 - ණය ඉල්ලුම් කළහැකි අවස්ථා

4.1 නිවසක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිලදීගැනීම/නිවසක් ඉදිකිරීම/නිවස අලුත්වැඩියා කිරීම සඳහා

4.2 ණය ඉල්ලුම්කරුගේ/ණය ඉල්ලුම්කරුගේ කලත්‍රයාගේ හෝ අවිවාහක දරුවෙකුගේ බරපතල රෝගාබාධයක් හේතුවෙන් වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම හෝ රෝහල්ගත වීම මත ඇතිවන වියදම් පියවීම සඳහා

4.3 ණය ඉල්ලුම්කරුගේ හෝ ණය ඉල්ලුම්කරුගේ දරුවෙකුගේ මංගල උත්සවයක් සඳහා

4.4 ණය ඉල්ලුම්කරුගේ භාවිතය සඳහා මෝටර් සයිකලයක් හෝ ත්‍රිරෝද රථයක් මිලදී ගැනීමට

4.5 ණය ලබාදීම සුදුසු යැයි ලේඛකාධිකාරීගේ නිර්දේශය මත උපකුලපති තීරණය කරනු ලබන වෙනත් ඕනෑම අවස්ථාවක

## 05 - ණය ඉල්ලුම්කරු

5.1 විශ්වවිද්‍යාලයේ ස්ථිර පත්වීමක වසරක (01) අඛණ්ඩ සේවා කාලයක් සපුරා ඇති සහ තම පළමු වැටුප් වර්ධකය ලබා ඇති, ණය මුදල අයදුම් කරන දිනට වයස අවුරුදු 57 නොඉක්මවූ අයෙකු විය යුතුය.

5.2 වැටුපෙහි ශේෂය සියයට 60 (60%) සීමාව නොඉක්මවිය යුතුය.

5.3 නැවත ණය ඉල්ලුම් කිරීම සඳහා කලින් ලබාගත් ණය මුදලින් හරි අඩක් (50%) හෝ ඊට වැඩි වාරික ප්‍රමාණයක් (මාසික වැටුපෙන් හෝ මුදලින්) ගෙවා අවසන් කොට තිබිය යුතුය.

5.4 ආසන්න වසර දෙක තුළදී, ණය ඉල්ලුම්කරු වැටුප් රහිත නිවාඩු ලබා නොතිබිය යුතු අතර, සේවා තත්ත්වය නිරීක්ෂණයට යටත් කර නොතිබිය යුතුය. එමෙන්ම ඔහුට/ඇයට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබිය යුතුය. (අනුමත වැටුප් රහිත නිවාඩු මෙයට ඇතුළත් නොවේ.)

## 06 - ණය සඳහා ඇප

6.1 ණය ඉල්ලුම්කරු වසර 10ක සේවා කාලයක් ඉක්මවා ඇත්නම් ඇපකරුවන් අවශ්‍ය නොවේ.

6.2 එසේ නොමැති අවස්ථාවක පහත සුදුසුකම් සපුරා ඇති ඇපකරුවන් දෙදෙනෙක් අවශ්‍ය වේ.

6.2.1 ඇපකරුවන් විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ ස්ථිර පත්වීමක වසර 05ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කළ වයස අවුරුදු 55 නොඉක්මවූ අයෙකු විය යුතු අතර ඔහුගේ/ඇයගේ සේවය ස්ථිර කර තිබිය යුතුය.

6.2.2 ඇපකරුවන් දෙදෙනාගේ වැටුපෙහි ශේෂය සියයට 60 (60%) සීමාව නොඉක්මවිය යුතුය.

6.2.3 එක් සේවකයෙකුට 60% සීමාව ඇතුළත ණය ඉල්ලුම්කරුවන් වෙනුවෙන් ඇප විය හැකිය.

6.2.4 ආසන්න වසර දෙක තුළදී, ණය ඇපකරුවන් වැටුප් රහිත නිවාඩු ලබා නොතිබිය යුතු අතර, සේවා තත්ත්වය නිරීක්ෂණයට යටත් කර නොතිබිය යුතුය. එමෙන්ම ඔහුට/ඇයට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබිය යුතුය. (අනුමත වැටුප් රහිත නිවාඩු මෙයට ඇතුළත් නොවේ.)

## 07 - ණය ඉල්ලුම් කිරීම සහ අනුමැතිය

7.1 ණය මුදල් ලබාදීම හෝ ලබානොදීම පිළිබඳව අවසාන තීරණය අවස්ථානුකූලව ලේඛකාධිකාරීගේ නිර්දේශය මත උපකුලපති විසින් තීරණය කරනු ලබනු ඇත.

7.2 ණය ඉල්ලුම්පත්‍ර නිකුත් කිරීම සහ භාරගැනීම සහකාර ලේඛකාධිකාරී/ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (පාලන) විසින් සිදුකෙරේ.

7.3 ණය ලබාගැනීම සඳහා බලාපොරොත්තු වන ඉල්ලුම්කරුවන් නිසි පරිදි සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය පොරොත්තු ලේඛනයට ඇතුළත් කරනු ලැබිය යුතු වන අතර, ඉල්ලුම්පත්‍ර ලැබෙන අනුපිළිවෙළ මත ණය නිකුත් කරනු ලැබේ.

7.4 ලේඛකාධිකාරී විසින් උපකුලපතිගේ අනුමැතිය සඳහා යොමු කරන ලද ණය ඉල්ලුම්පත් උපකුලපති අනුමැතිය සහිතව නැවත ලේඛකාධිකාරී වෙත යොමු කිරීමෙන් අනතුරුව ණය මුදල ගෙවීම සඳහා මූල්‍යාධිකාරී වෙත යොමු කෙරේ.

## 08 - ණය මුදල් නිකුත් කිරීම සහ ආපසු අයකර ගැනීම

8.1 ණය මුදල් නිකුත් කිරීම සහ ආපසු අයකිරීම සම්බන්ධ වගකීම මූල්‍යාධිකාරී විසින් දැරිය යුතුය.

8.2 අනුමත ණය මුදල ඉල්ලුම්කරුගේ බැංකු ගිණුමට බැර කරනු ලැබේ.

8.3 ණය ඉල්ලුම්කරු විසින් තම මාසික වැටුපෙන් ණය වාරික අය කරගැනීම සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍යාධිකාරී වෙත තම ලිඛිත කැමැත්ත ප්‍රකාශ කළයුතු වන අතර, කිසිම හේතුවක් යටතේ මුදලින් ගෙවීම් සිදුකළ නොහැකිය.

8.4 ණය මුදල් ආපසු ගෙවීම පැහැර හැරීමකදී අදාල ණය මුදලේ ශේෂය සහ නියමිත පොළී මුදල ඇපකරුවන් දෙදෙනා විසින් සමාන කොටස් වශයෙන් ගෙවිය යුතුය.

8.5 ණයකරු සේවයෙන් විශ්‍රාම යාමේදී/සේවයෙන් ඉවත් වීමේදී හෝ ඉවත් කිරීමකදී හෝ ණය මුදලේ යම් ශේෂයක් පවතින්නේ නම් එය ඔහුගේ/ඇයගේ පාරිතෝෂික මුදලින් අය කරගත යුතුය.